- **යුගල පද**

ගමන් බිමන් ,අහල පහල , සිරිත් විරිත් ,තෑගි බෝග ,කෑම බීම

- මෙම යුගල පද කියවීමට යොමු කරන්න.
- එක් එක් යුගල පද වෙන් වෙන් ව ගෙන වාක්‍ය ගොඩ නගන්න.

**යුගල පද යනු දෙකක් බවත් එක වර වචන දෙකක් ම යෙදීම යුගල පදවල විශේෂත්වය වේ. මෙම යුගල පද භාවිතය නිසා කතා කරන දේ ලියන දේ අලංකාර වේ.**

**ඉගෙනීමේ අගය**

"පුතා මෙහෙට එන්න. මේ බලන්න ඔයාගේ පොත් මේසේ හැටි. මේසේ පුරා ම පොත් පත්. ඔය මල්ලිත් එක්ක එන්න ගෙට. ඇවිත් මේ පොත් මේසෙ පිළිවෙළට අස් කරන්න." ගේ ඇතුළේ සිට අම්මා උස් හඬින් කීවාය. "මේ එනවා අම්මේ" කිසිවක් නොකළ ලෙස දිනෙත්, මල්ලි සමඟ සාලයට ආවේය.

"ඕනෑ ම කෙනෙකුට කොයි තරම් ගෙවල් දොරවල්, යාන වාහන, වතු පිටි තිබුණත් වැඩක් වෙන්නෙ නැහැ. ඉගෙන ගත්ත ම තමයි සම්පූර්ණ කෙනෙක් වෙන්නේ. ඒක තේරෙන්න තව ම ඔයගොල්ලො පුංචි වැඩි යි පුතේ." තාත්තා දිනෙත්ගේ හිස අත ගාමින් කීවේ තිබෙන ආදරයට විය යුතු යැයි දිනෙත්ට සිතිණ."කෙළි සෙල්ලම් හැම තිස්සෙ ම ඕනෑ නැහැ. හොඳ පුතාලා වගේ අත පය සෝදාගෙන පාඩම් වැඩ කරන්න" අම්මා කීවාය. පසු ව දිනෙත් මල්ලි සමඟ පාඩම් වැඩ කළේ බොහෝ සතුටිනි.

- උගත් යුගල පද අඩංගු වන සේ වාක්‍ය සකස් කර හිස්තැන් පිරවීමට සිසුන් යොමු කරන්න.

1. අපි . . . . . . . . පිරිසිදුව තබා ගනිමු.
2. අපේ . . . . . . . . . . . අලංකාරව තබා ගනිමු.
3. පාරේ . . . . . . . . . . . . තදබදය වැඩිවෙමින් පවතී.
4. බොහෝ ගම් වැසියෝ . . . . . . . . . . . වලින් ආදායම් ලබති.
5. පුංචි ළමයි . . . . . . . . . . . . . . වලට බොහෝ කැමැත්තක් දක්වති.